www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩිමොක්‍රැටික් පක්ෂ සම්මේලනය හා ද්වි-පක්ෂ ක්‍රමයේ අර්බුදය

**The Democratic convention and the crisis of the two-party system**

**කර්තෘ මන්ඩලය විසිනි**

**2004 ජුලි 26**

සඳුදා බොස්ටන් නුවර ඇරඹි ඩිමොක්‍රැටික් ජාතික සමුලුව, ඇමරිකාව මුහුන දී සිටින ඉතා මත් ම තීරනාත්මක කාරනය වන ඉරාකයේ යුද්ධය පිලිබඳව නොවැම්බරයේ පැවැත්වෙන ජනාධිපතිවරනයේ දී කිසි යම් හෝ විවාදයක් වලක්වා ලීමේ ලා ඩිමොක්‍රැටික් පක්ෂයේ ඉතා ම බලසම්පන්න කොටස්, මාධ්‍ය සහ සමස්තයක් ලෙස ඇමරිකානු පාලක ප්‍රභූව ගත් වැයම මල්පල ගැන්වීමක් විය.

ඉදිරියේ දී සිදු වීමට නියමිත මැසචුසෙට්ස් සෙනෙට් සභික ජෝන් කෙරී ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂකයා ලෙස ඔටුනු පැලඳවීම, ඩිමොක්‍රැටික් පාක්ෂික ඡන්ද දායකයන්ගේ ද පොදුවේ මහජනයාගේ ද යුද විරෝධී මානසිකත්වය එක් කරන ලක්ෂ්‍යය බවට පත් වූ එවකට ඉදිරියෙන් ම සිටි හොවාඩ් ඩීන්ගේ නාම යෝජනා දිනා ගැනීමේ වැයමට යටින් වල කැපීමට ඩිමොක්‍රැටික් ප්‍රාථමික තරග අතරතුර දී දියත් වූ සැලසුම්ගත ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. අරමුන වූයේ යුද විරෝධී මානසිකත්වය නිහඬ කර මර්දනය කිරීම ය.

දේශපාලන ප්‍රජා අනුශක්‍යතාවේ මෙම සන්තතිය කෙරී සහ ඔහුගේ දෙවැනියා වන උතුරු කැරොලිනාවේ සෙනෙට් සභික ජෝන් එඩ්වර්ඩ්ස් නිල වසයෙන් පිලිගනු ලැබීමෙන් සමාප්තියට පත් වීමට නියමිත ය. දෙදෙන ම ඇමරිකානු පාලක ප්‍රභූවේ ප්‍රකෝටිපති නියෝජිතයෝ ය. 2002 ඔක්තෝබරයේ දී දෙදෙන ම ඉරාකයට පහර දීමට බුෂ්ට බලය පැවරෙන කොන්ග්‍රස් යෝජනාවට පක්ෂව ඡන්දය දුන්හ. දෙදෙන ම දේශප්‍රේමී පනතට පක්ෂව ඡන්දය දුන්හ. එම පනත ඊනියා ''ත්‍රස්ත විරෝධී යුද්ධය'' ගෙන යාමේ ප්‍රෝඩාවට මුවා වී ඇමරිකානු ජනතාවගේ ඔත්තු බැලීමට ද සීඅයිඒයට, එෆ්බීඅයියට සහ අනෙකුත් පොලිස් සංවිධානවලට පෙර නුවූ විරූ බලතල ලබා දෙයි.

ඉරාකය ආක්‍රමනය කිරීමට ගත් බුෂ්ගේ තීන්දුව පිලිබඳව ස්ථාවරයක් ගැනීම ප්‍රතික්ෂේප කල පක්ෂ වේදිකාව ද ගැටලුව පිලිබඳව සභාවේ ඇති වන යම් හෝ විවාදයක් මඬේ එබීමට ඔහියෝ කොන්ග්‍රස් සභික ඩෙනිස් කුසිනිච් පල කල එකඟතාව ද ඉරාකයේ දැනට පවත්වා ගෙන යන යුද්ධය සහ මිලිටරි ග්‍රහනය සම්බන්ධව විවාදයක් නො සිදු වන බව තහවුරු කල මුද්‍රාව තැබී ය. ප්‍රාථමික ඡන්ද විමසීම්වල දී යුද්ධයට විරුද්ධව වැඩිපුර ම හඬ නැගූ කුසිනිච් එහි අන්තයේ දී කෙරීට අනුමතිය පල කිරීම මගින් ඔහු යුද්ධයේ ප්‍රශ්නය කුනු කූඩයට දමා ඇති බව සංලක්ෂනය කලේ ය.

සමුලු නියෝජිතයන් දහයෙන් නම දෙනකු ම ඇමරිකාව ඉරාකයේ යුද්ධයට නො යා යුතුව තිබුනේ ය යි සිතන බව පෙන්නුම් කරමින් ඉරිදා *නිව් යෝක් ටයිම්ස්* / සීබීඑස් මාධ්‍ය නිකුත් කල මත විමසුමක් මගින්, ඩිමොක්‍රැටික් පාක්ෂික ඡන්ද දායකයන්ගේ මනෝභාවයන් පිලිබඳව පක්ෂ නායකත්වයේ අවඥාව මෙන් ම යම් හෝ ප්‍රජාතාන්ත්‍රිය සාකච්ඡාවක් ඇති වීම මඬේ ඔබා තැබීමේ වැයම ද අවධාරනය කර දැක්විනි.

සමුලුවට පූර්ව කාලයේ දී, වැඩිපුර හමුදා නො යැවීම සහ පොදුවේ විජිත ව්‍යාපෘතිය අවුල් කර ගැනීම පිලිබඳව මූලිකව බුෂ් විවේචනය කරමින්, ඉරාකයේ මිලිටරි ග්‍රහනය දැඩි කිරීම සහ ඇමරිකානු විරෝධී කැරලිකාරිත්වය අතු ගා දැමීම පිලිබඳව ඔහුගේ සහයෝගය අවධාරනය කරනු පිනිස කෙරී දැඩි වෙහෙසක් ගත්තේ ය. ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' පිලිබඳව සහ අනවශ්‍ය ආන්ඩු පෙරලා දැමීමටත් එම ජනතාවන් සතු භූමිභාගයන් හා සම්පත් අල්ලා ගැනීමටත් මිලිටරි බලය යෙදවීමේ බුෂ් පරිපාලනයේ පිලිවෙතෙහි මධ්‍ය මෙවලම වන පූර්වභංග යුද්ධ ප්‍රතිපත්තිය සඳහා ද ඔහු ඔහුගේ සහයෝගය නැවත නැවතත් ප්‍රකාශ කලේ ය.

කෙරී ශක්තිමත් මිලිටරි නායකයකු සහ ''දේශයේ ආරක්ෂාව'' බල ගැන්වීම පිලිබඳව දැඩි මතධාරියකු ලෙස පින්තාරු කරමින් ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' මත බුෂ් පරයා යාම සඳහා සමුලුව භාවිත කිරීමට තමන් බලාපොරොත්තු වන බව ඩිමොක්‍රැටික් පක්ෂ නිලධරයෝ පැහැදිලිව පෙන්නුම් කලහ. ඇමරිකානු රහස් ඔත්තු සේවා, ආරක්ෂක සහ පොලිස් ආයතනවල බලය තහවුරු කර ඒවා ශක්තිමත් කිරීම සඳහා ඉදිරිපත් කල 9/11 කොමිසමේ දුරදිග යන්නා වූ හා ප්‍රජාතන්ත්‍ර විරෝධී යෝජනා වැලඳ ගැනීමට ඩිමොක්‍රැටික් අපේක්ෂකයා යුහුසුලු විය.

*නිව් යෝක් ටයිම්ස්* පුවත්පතේ සිකුරාදා පල වූ සම්මුඛ සාකච්ඡාවක දී, ''මට ත්‍රස්තයට එරෙහිව වඩාත් ඵලදායී යුද්ධයක් කල හැකි ය'' යි පවසමින් කෙරී සමුලුව තුල දී තමන් ගන්නා ප්‍රවිෂ්ටය සම්පින්ඩනය කලේ ය.

## කප්පාදුව සහ මිලිටරිවාදය

දේශීය සමාජ ගැටලු පිලිබඳව ''ද්විත්ව ඇමරිකාව''අරබයා හිස් වාං මාලාවන් ද ධනවතුන්ට බුෂ්ගෙන් ලැබෙන නො මසුරු බදු සහනයන් ගැන විවේචනයන් ද සමුලුවේ දී කරනු ඇතැයි යමකු බලාපොරොත්තු විය හැකි වුව ද කෙරීගේ ඡන්ද ව්‍යාපාරය සමාජ ප්‍රතිසංස්කරන සඳහා වන සංයුක්ත යෝජනාවන්ගෙන් වැලකී සිටින අතර ''පන්ති යුද්ධය'' පිලිබඳව පුරසාරම්වලින් ඉවත්ව සිටීමට සංස්ථාපිතයේ මාධ්‍යයන් නිකුත් කල නියෝග කෙරේ අවනත විය.

ජනගහනයෙන් අතිවිශාල කොටසක වැඩෙන ආර්ථික අහේනියක කොන්දේසි යටතේ ඩිමොක්‍රැටිකයන්ගේ සමාජ පිලිවෙත පිලිබඳව ඉගියක් පසු ගිය සතියේ නාගරික සංගමය ඉදිරියේ කෙරී පැවැත්වූ කතාවකින් එලිමහනට පැමිනියේ ය. තම නාගරික සේවා ලේඛනයේ මධ්‍ය නාභිය ලෙස ඔහු ඉදිරිපත් කල මධ්‍යම රජයෙන් අරමුදල් සැපයෙන තරුන අපරාධ මර්දනය සඳහා යෝජිත රැකියා පුහුනුව හා මත් උවදුරට ගොදුරු වූවන්ට ප්‍රතිකාර වෙනුවෙන් දස වසරක් සඳහා වන ඩොලර් මිලියන 400, ඩොලර් ට්‍රිලියනය ඉක්මවන ෆෙඩරල් අයවැය සමග ගත් විට සාගරයෙන් ගත් ජල බිඳුවක් වැනි ය.

කෙරී මෙම වැඩ පිලිවෙල නිවේදනය කල දිනයේ ම කොන්ග්‍රසය ඉරාකයේ සහ ඇෆ්ඝනිස්ථානයේ මිලිටරි මෙහෙයුම් සඳහා වන අතිරේක ඩොලර් බිලියන 25ක් ද ඇතුලුව ඩොලර් බිලියන 417.5ක පෙන්ටගන අයවැයක් විශාල වැඩි ඡන්දයකින් අනුමත කලේ ය. ඡන්ද විමසීමේ දී ඩිමොක්‍රැටික් පක්ෂය රිපබ්ලිකානුවන් සමග එක පයින් එක් වීමෙන් සෙනෙට් මන්ඩලයේ දී 96ට 0ක් ලෙස ද කොන්ග්‍රසයේ දී 410ට 12ක් ලෙස ද මෙය අනුමත කෙරිනි.

කෙරීගේ දේශීය ආර්ථික පිලිවෙතෙහි සාරය සහ බුෂ් පරිපාලනයේ පිලිවෙත්වලට එල්ල වන ඔහුගේ ප්‍රහාරයේ මධ්‍ය නාභිය ද වනු ඇත්තේ මූල්‍ය විනය සඳහා කැඳවුමක් ය. වාර්තාගත අයවැය හිඟය සහ දැවැන්ත මිලිටරි වියදම්වල කොන්දේසි යටතේ මෙහි එක ම අර්ථය විය හැක්කේ සමාජ වැඩ සටහන් තව දුරටත් කප්පාදු කර දැමීම ය.

බුෂ් පරිපාලනයට එක එල්ලේ කෙරෙන දේශපාලන පහර දීමකට එරෙහිව කෙරීගේ සහ අනෙකුත් ඩිමොක්‍රැටිකයන්ගේ දැනමුතුකම්වලින් සමුලුව තව දුරටත් දකුනට හැරීම සනිටුහන් කෙරුනි. සති අන්තයේ දී ඩිමොක්‍රැටික් ජාතික සභාපති ටෙරී මැක් ඕලිෆ් මෙසේ ප්‍රකාශ කලේ ය: ''මෙය ජෝර්ජ් බුෂ්ට පහර දීම පිලිබඳ ප්‍රශ්නයක් නො වනු ඇත.''

තහනම් කරන ලද මාතෘකා අතර 2000 මැතිවරන සොරා කෑම එකකි. බුෂ් කෙරේ විවෘතව එල්ල කෙරෙන ඕනෑ ම විරෝධය පෑමක් හෝ වර්තමාන ආන්ඩුවේ අවජාතක සම්භවය සහ ඒකාධිකාරී ස්වරූපය පිලිබඳව කෝපය හෝ යටපත් කර දැමීමේ පක්ෂ ඉහල තන්ත්‍රයේ වෑයම සමග එකට පෙල ගැසෙමින්, 2000 ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂකයා වූ හිටපු උපජනාධිපති අල් ගෝර්ගේ කථාව ගුවන් විදුලි මාධ්‍යයෙන් විකාශය වීම වැලැක්වීමට සංවිධායකයෝ වග බලා ගත්හ. එන්බීසී, ඒබීසී, සීබීඑස් හා ෆොක්ස් රූපවාහිනී ජාලයන් විසින් නාමමාත්‍ර පක්ෂ නායකයාගේ කතාව ද ඇතුලත් සමුලුව ආවරනය කිරීමට වෙන් කර තිබූ කාලය පැයකට සීමා කරනු ලැබුනි.

සැලසුම් කරනු ලබන්නේ කෙරීගේ වියට්නාම් යුද වාර්තාව මධ්‍ය වේදිකාව කර ගත් කොඩිය වැනීමේ දේශප්‍රේමී ප්‍රීති උන්මාදයකි. නම හෙලි නො කල ''ජ්‍යෙෂ්ඨ ඩිමොක්‍රැටිකයකු'' *නිව් යෝක් ටයිම්ස්* පුවත්පතට මෙසේ පැවසී ය: ''දේශප්‍රේමය සහ අපගේ රට රැක ගැනීම පිලිබඳව ප්‍රවීනයන් වැඩි වැඩියෙන් කතා කරනු ඔබට අහන්ට දකින්ට ලැබෙනු ඇත. රිපබ්ලිකන් සමුලුවක් දෙස බලා සිටින බවත් ඔබට සිතෙනු ඇත.''

මෙම දක්ෂිනාංශික පීලි මාරුවේ අනෙක් රූපය වනුයේ, මාධ්‍ය භාෂාවට අනුව ''ස්වාධීන'' සහ ''පාවෙන'' ඡන්ද දායකයන්ට කරන ආයාචනයක් ලෙස වමෙන් එන දේශපාලන අභියෝගයන් නිහඬ කිරීමේ රුදුරු පරිශ්‍රමයක් ය. ඉරාකයේ යුද්ධය විවේචනය කරන්නා වූ ද දසලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් සහ තරුනයන් තුල බුෂ් පරිපාලනය කෙරේ පවතින ප්‍රගාඪ වූ වෛරය කුමන ආකාරයකින් හෝ ප්‍රකාශ කරන්නා වූ ද සියලු තුන් වන පාක්ෂික සහ ස්වාධීන අපේක්ෂකයන් ඡන්ද ලේඛනයෙන් ඉවත් කර තැබීමට ඩිමොක්‍රැටික් පක්ෂය ජාතික පරිමානයේ ප්‍රයත්නයක නියැලී සිටී. ඩිමොක්‍රැටික් පක්ෂය රැල්ෆ් නාඩර්ගේ සහ හරිත පක්ෂයේ ඡන්ද අපේක්ෂකත්වය අහිමි කිරීමට ක්‍රමානුකූලව වැඩ කරමින් සිටින අතර ඉලිනොයිස් රාජ්‍ය මන්ත්‍රන සභාවට ඉදිරිපත් වී සිටින සමාජවාදී සමානතා පක්ෂ අපේක්ෂක ටොම් මැකමන් ඡන්ද ලේඛනයෙන් ඉවත් කර තැබීමට නිර්ලජ්ජිත ප්‍රජාතන්ත්‍ර විරෝධී මෙහෙයුමක යෙදී ගෙන සිටී.

සියලු ම බැරෑරුම් විසංවාදී හඬ නැගීම් දේශපාලන සන්තතියෙන් බැහැර කර තැබීමට ද ජනතාවගෙන් අතිමහත් බහුතරයක ඉතා ම තීරනාත්මක උත්සුකයන් මැඩ ලා තැබීමට ද - යුද්ධය පිලිබඳව පමනක් නො ව රැකියා, ජීවන තත්වයන් සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත සිදු කෙරෙන ප්‍රහාරයන් ගැන ද - වන මෙම ප්‍රයත්නය, ඓතිහාසික පරිමානයක් ගන්නා ඉහල යන සමාජ සහ දේශපාලන අර්බුදය විසඳීම කෙසේ වෙතත් ඒවා ගැන සලකා බැලීමට වත් ඇමරිකාවේ ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙකට තිබෙන ඓන්ද්‍රිය නො හැකියාවට දෙස් දෙයි.

## ප්‍රජාතන්ත්‍රවාදය හෑල්ලු කිරීමක්

මනා සැලැස්මක් සහිතව සකසන ලද සමුලුවේ ස්වභාවය ඒ හේතුවෙන් ම ද්වි- පක්ෂ ක්‍රමයේ අර්බුදයෙහි තවත් ප්‍රකාශනයක් බවට පත් වෙයි. බොස්ටන්හි දී කෙරෙන රංගනය යම් හෝ යථාර්ථවත් විවාදයකින් හෝ අරගලයකින් වියෝ වූ මාධ්‍ය

සංදර්ශනයකි. එහි ඇත්තේ හිස් යාතු කර්මයක ස්වභාවයකි. සමාජ හා දේශපාලන බෙදීම්වලින් ඉරී ගියා වූ ද සමාජ ගැටලු රාශියකින් පීඩාවට පත් වූ ද යුදාවතීර්න වූ රටක් පසුබිම් කර ගත්තා වූ ද සියල්ලට මත් වඩා දැවැන්ත සහ ඉහල ම විවිධත්වයකින් යුත් රටක, බොස්ටන් සෝබනය පවතින දේශපාලන සැකැස්ම සහ ඇමරිකානු සමාජයේ යථාර්ථය අතර බෙදුම්කඩනය සනිටුහන් කරයි.

මෙය වනාහි සංගත මගින් පාලනය වන මාධ්‍ය ප්‍රධාන භූමිකාවක් ඉටු කරන්නා වූ දේශපාලන පද්ධතියකි. පතුලේ කැලඹෙන පුලුල්ව පැතිරුන අසන්තෘප්තියේ වැස්ම ගැලවේ ය යි බියෙන් කිසිදු බැරෑරුම් සමාජ ප්‍රශ්නයක් ඉස්මතු කිරීමට පසුබට වන්නා වූ මෙම මාධ්‍ය මූල්‍ය වංශාධිපතිත්වයේ ආධිපත්‍යයට මුලුමනින් ම නතුව පවතින අතර විවෘතව ද සෘජුව ද ඔවුන්ගේ උවමනාවන්ට සේවය කරයි.

*නිව් යෝක් ටයිම්ස්* හි සමුලු-පූර්ව කතුවැකියක් මේ සමස්ත කටයුත්තේ ම අර්ථය කුමක් ද යන ප්‍රශ්නය මතු කිරීම සුදුසු ය යි සිතා තිබුනි. ඩිමොක්‍රැටික් වේදිකාව ඉරාක ආක්‍රමනය පිලිබඳව ස්ථාවරයක් ගැනීම පවා ප්‍රතික්ෂේප කල බව ද ඒ ගැන කිසිදු තථ්‍ය විවාදයකට අවසර නො ලැබෙන බව ද එබැවින් සමුලුව වනාහි දේශපාලන ඔටුනු පැලඳවීමක් බව ඒත්තු ගනිමින් මෙම පුවත්පත සමුලුව ආවරනය කිරීමේ දී රැයක වැඩි ම දෙනා නරඹන වේලාවෙන් පැයකට මාධ්‍ය ජාලයන් විසින් එය සීමා කරනු ලැබීම පිලිබඳව වාද කල නො හැකි බව පැවසී ය. කෙසේ වෙතත් පුවත්පත සිත් තැවුලෙන් යුතුව මෙසේ සමාප්ත කර තිබුනි: ''එහෙත් මෙය පවත්වා ගෙන යාමට වටිනා චාරිත්‍රයකි. නියෝජිතයන්ට කරන්නට වැඩි දෙයක් නො තිබීමට පුලුවන. එහෙත් ඒ අයගේ සමාගමය වැදගත් ය.''

යම් තාක් දුරකට ප්‍රතිඵලය කලින් සැලසුම් නො කලා වූ, ප්‍රතිපත්තීන් පිලිබඳ විවාදයක ස්වරූපය ගත් ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙකේ ජාතික සම්මේලන පැවැත්වූයේ දශක තුනකටත් වඩා පූර්වයෙන් ය. සම්මේලනයන් කිසි යම් හෝ අව්‍යාජ අන්තර්ගතයකින් තොර වීම ද ඒවා මුලුමනින් ම යාතු කර්මයන් බවට පත් වීම ද නිශ්චිත දේශපාලන හා සමාජ සන්තතීන් හා බැඳී තිබේ.

පලමු කොට ම ධනේශ්වර පක්ෂ දෙක ම දකුනට කැරකී යාම ද ඩිමොක්‍රැටික් පක්ෂය විසින් ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්ගේ ''නිව් ඩීල්'' සැලැස්මේ යුගයෙහි සිට ඇතුලත් කර ගෙන සිටි සමාජ ප්‍රතිසංස්කරන පිලිවෙත් බැහැර කරනු ලැබීම තුල පැහැදිලි ම ප්‍රකාශනය අත්පත් කර ගන්නා ඇමරිකානු ලිබරල්වාදයේ බිඳ වැටීම ද වෙයි.

මෙම සංසිද්ධිය පක්ෂ දෙකේ ම මහජන පදනම ඛාදනය වීම සහ ඒවා වැඩි වැඩියෙන් ම මූල්‍ය සහ ව්‍යාපාරික ප්‍රභූවේ නග්න ආධිපත්‍යයට යටත් වීම සමග බැඳී පවතී. ඩිමොක්‍රැටික් පක්ෂයේ පදනම කුමක් ද? එය සමන්විත වනුයේ මූල්‍ය සහ ව්‍යාපාරික ප්‍රභූවේ කොටස්වලින් සහ වෘත්තීය සමිති නිලධරය ද කලු ජාතික, හිස්පැනික සහ අනෙකුත් සුලු ජනයාගේ ඉතා ම ඉසුරුමත් කොටස් ද ඇතුලත් මධ්‍යම පන්තියේ වරප්‍රසාදිත සහ පටු ස්තරයකිනි.

රිපබ්ලිකන් පක්ෂය මූල්‍ය කතිපයාධිකාරයේ අතිශයින් කෑදර කන්ඩායම්වල උවමනාවන් සහ ඉල්ලීම් ඉතා මත් ම අවිරෝධීව සහ කුරිරු ලෙස ප්‍රතිරාවය කරන අන්ත දක්ෂිනාංශිකයන් කන්ඩායමක ආධිපත්‍යයට නතුව තිබේ. ඇමරිකානු ධනවාදයේ අර්බුදය තීව්‍ර වීමත් සමග වෙන කවර දාටත් වඩා අධිකාරවත් තැනක් ලබා ගැනීමට මෙම කන්ඩායම් පෙරට ගමන් ගෙන තිබේ.

පක්ෂ දෙකේ දේශපාලන වැහැරී යාම සහ දක්ෂිනාංශික ගමන් මග යටින් පවතිනුයේ සමාජ අසමානතාවේ වර්ධනය ය. ඉතා කුඩා අතිශයින් ම ඉසුරුමත් මූල්‍ය කතිපයාධිකාරයක් සහ පලල් කම්කරු ජනතාවකි. ඇමරිකාව පෙර නො වූ විරූ ආකාරයකට බෙදී යාම ද්වි-පාක්ෂික අට්ටාලය වැඩි වැඩියෙන් වැරහැලි වී ඇට පැදී ඇති බව විදහා දක්වයි. මෙම සන්තතිය තුල කම්කරු ව්‍යාපාරයේ කඩා වැටීම සහ මොන යම් අයුරකින් හෝ කම්කරු පන්තියේ උවමනාවන් හඬ නංවන ජනතා සංවිධාන නොමැති වීම වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කර තිබේ.

නො විසඳිය හැකි ප්‍රතිවිරෝධයන්ගෙන් දෙගොඩ තලා ගිය ධනපති ක්‍රමය තුල තව දුරටත් සමාජ ප්‍රතිසංස්කරනයේ පක්ෂයකට ඉඩ නැත. ඒ වෙනුවට මහජනයා මුහුන දී සිටින්නේ පක්ෂ අතර ගැටුම් කෙතරම් තියුනු, පුපුරනසුලු වුව විදේශයන්හි ඇමරිකානු ගෝලීය ආධිපත්‍යයේ ද රට තුල සමාජ ප්‍රතිගාමිත්වයේ ද මූලෝපායට සිය කැප වීම වෙනුවෙන් එක්සත් වූ දක්ෂිනාංශික පක්ෂ දෙකකට ය.

## වට ලනු ලැබූ තත්වය

සමහර විට යටින් පවතින සමාජ සහ දේශපාලන අර්බුදයේ අමු ම අමු ප්‍රකාශනය ඩිමොක්‍රැටික් සමුලුව වට කර ගත් අසාමාන්‍ය හා පෙර නුවූ විරූ ආරක්ෂක විධිවිධානයන් ය. ක්‍රියාශීලී ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රදර්ශන කවුලුවක් සේ සැලකෙන මෙම කටයුත්ත පවත්වනු ලබන්නේ සැබෑ වසයෙන් ම වට ලනු ලැබූ තත්වයක් යටතේ ය. බොස්ටන්හි සමස්ත පදාසයක් ම වසා තැබින. මාර්ග බාධක අටවනු ලැබ ඇත. සාමාන්‍ය ජනතාව සමුලු පරිශ්‍රයෙන් ඉවත් කර තැබින. දහස් ගනන් පොලිස් ආරක්ෂක භටයන් ද සිවිල් ඇඳුමෙන් සැරසුනු ෆෙඩරල් ඔත්තුකරුවෝ ද නගරයට ඇතුල් කරනු ලැබෙත්. පොලීසිය අතුරු මාවත් භාවිත කරන ජනතාව සතු දේ අතරින් පතර පරීක්ෂාවට ලක් කරති.

සමුලු පරිශ්‍රය අසල කුමන තැනක හෝ පෙලපාලි සඳහා රැස්වීම තහනම් ය. ඔවුහු ''කතා කිරීමේ නිදහස ඇති කලාප'' - එවැන්නක් වී නම් මේ ඕවල්ගේ වදනකි. ඔවුන්ට කීමට ඇති දේ කිසිවෙකුටත් නො ඇසෙන තැන්වල සිට - නම් කටුකම්බිවලින් වට කල හුදෙකලා ස්ථානවලට ගාල් කරනු ලැබූහ.

මේ අතරවාරයේ දේශපාලනඥයන් සහ ව්‍යාපාරික

හොර බලල්ලු බැරිකේඩ සහ සන්නද්ධ පොලිස් සේනාංක පිටුපසට වී ව්‍යාපාර අනුග්‍රහයෙන් ලත් ප්‍රීති ප්‍රමෝදයේ සිත් සේ කිමිදෙමින් සිටිති.

මෙම පියවරයන් ගෙන තිබෙන්නේ කෝපයට පත් විරෝධතාකරුවන්ගේ විශාල කන්ඩායම්වලින් සම්මේලනය රැක ගැනීම සඳහා නො වේ. පෙලපාලි සාපේක්ෂව කුඩා හා දේශපාලනිකව දමනය කල ඒවා වන බවට පෙර නිමිති තිබේ. විරෝධතා කන්ඩායම් සහ වාම ලිබරල් සංවිධාන බොහොමයක් කෙරී පිටුපස පෙල ගැසෙමින් සිටින අතර ඔවුන් සැලසුම් කල සියලු කටයුතු දේශපාලනිකව සතුරු ඒවා නො ව සමුලුවට දෙන නිල නො වන මුක්කු ලෙස පවත්වනු ලැබේ.

මෙය සනිටුහන් කරන්නේ දැවැන්ත පොලිස් මෙහෙයුමට පිටුපසින් අප්‍රකාශිත න්‍යාය පත්‍රයක් පවතින බව පමනි. නිල යුක්තිකරනය වූයේ චිරස්ථායී තර්ජනයේ සහ නිමක් නැති යුද්ධයේ පශ්චාත් 9/11 වටපිටාව තුල පවත්නා ත්‍රස්තවාදී ප්‍රහාරයක අනතුර ය. එහෙත් සමුලුවට පහර දීමෙහි ලා ත්‍රස්තවාදීන්ගේ කිසිදු විශේෂිත තර්ජනයක් පිලිබඳව සාක්ෂ්‍ය ඉදිරිපත් නො කෙරුනි.

අරමුන වසයෙන් පවතින්නේ තැති ගැන්වූ වටපිටාවක් නිර්මානය කිරීම ද පොලිස් රාජ්‍ය ක්‍රමවේද භාවිතය සහ මැතිවරන පැවැත්වීමත් ඇතුලුව ප්‍රජාතන්ත්‍ර අයිතීන් මර්දනය නියාමයක් ලෙස පිලිගැනීමට මහජනතාව පදම් කර ගැනීම ය. බුෂ් පරිපාලනය සමුලුවට පෙරාතු සතිවල දී මැතිවරන - පූර්ව ත්‍රස්තවාදී ප්‍රහාර පිලිබඳව බිහිසුනු අනතුරු ඇඟවීම් කල අතර එවන් ප්‍රහාරයක හැකියාව යටතේ නොවැම්බර් මැතිවරනය කල් තැබීමේ හෝ අවලංගු කිරීමේ තත්වය පිලිබඳව තමන් අභ්‍යන්තර සාකච්ඡාවල නිරතව සිටින්නේ ය යන වාර්තා මාධ්‍ය වෙත කාන්දු කලේ ය.

බොස්ටනයේ පොලිස් රාජ්‍ය ක්‍රියාන්විතය ත්‍රස්තවාදීන්ගෙන් වන ඕනෑ ම බාහිර තර්ජනයකට වඩා ඇමරිකාවේ අභ්‍යන්තර අර්බුදය සමග බැඳී පවතින්නකි. ඉන් පන්ති බෙදීම් සහ සමාජ ආතතීන් හේතුවෙන් ඉරි තැලී ගිය සමාජයක ඡායා පිටපතක් සම්පාදනය කරයි.

සමස්තයක් ලෙස ගත් කල ඩිමොක්‍රැටික් සමුලුව ද්වි - පක්ෂ ක්‍රමයේ අර්බුදය පවත්නා දේශපාලන සැකැස්මට ඇත්තේ ස්වාධීන පක්ෂ දෙකක ස්වභාවය නො ව නියෝජන දෙකකින් යුක්තව තනි දේශපාලන ව්‍යුහයක ස්වභාවය ය. මෙම පද්ධතිය කම්කරු පන්තියේ උවමනාවන් කුමන අයුරකින් හෝ ස්වාධීනව ප්‍රකාශයට පත් වීම වලක්වා ලීමේ මාර්ගයක් ලෙස ධනපති පන්තියේ පාලනය සහ මූලික උවමනාවන් ආරක්ෂා කිරීමේ මාර්ගයක් ලෙස ද දිගු කලක් තිස්සේ පවත්වා ගෙන එනු ලැබී ය.

මෙය මරනීය අර්බුදයක තිබෙන පද්ධතියකි. එයට තව දුරටත් ජනතාව සඳහා ප්‍රජාතන්ත්‍රවාදී වාහකයක් ලෙස පෙනී සිටීමට හැකියාව නැත. එයට තව දුරටත් ඇමරිකානු සමාජයේ සමාජ ප්‍රතිවිරෝධතා සමහන් කිරීමේ හැකියාව නැත. සමස්තයක් ලෙස ගත් කල පොලිස් රාජ්‍ය පාලනයක් දෙසට සංක්‍රමනය වීමක් ඇතුලත් කර ගත්තා වූ පාර්ලිමේන්තුවාදී සහ ව්‍යවස්ථාමය නො වන ක්‍රමවේදයන් දෙසට වඩ වඩාත් නග්න සහ අන්තරායකාරී හැරීම සිදු වන්නේ එබැවිනි.

සමාජවාදී සමානතා පක්ෂයේ 2004 මැතිවරන ව්‍යාපාරයේ වැදගත්කම තිබෙන්නේ මෙහි ය. සසපය පමනක් ම ජනගහනයෙන් අතිමහත් බහුතරයක් වන කම්කරු ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් හඬ නගන විප්ලවවාදී සමාජවාදී ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කරයි. අපගේ පක්ෂය ඉරාක යුද්ධය අත්හිටුවා ඇෆ්ඝනිස්ථානයෙන් හා ඉරාකයෙන් සියලු ම ඇමරිකානු සහ විදේශීය හමුදා වහා ම ඉවත් කිරීමටත් බල කර සිටියි. අපි දේශප්‍රේමී පනත වහා ම අහෝසි කිරීම, අභ්‍යන්තර ආරක්ෂක දෙපාර්තමේන්තුව විසුරුවා හැරීම සහ ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් කප්පාදු කිරීමට ගන්නා ලද සියලු විධිවිධානයන් ඉවත් කිරීම ඉල්ලා සිටිමු.

හොඳ වැටුප් සහිත රැකියා, සෞඛ්‍ය පහසුකම්, යහපත් පාසල්, දැරිය හැකි නිවාස සහ විශ්‍රාම වැටුප් සඳහා මහජනයාට ඇති අවශ්‍යතාවන්, ව්‍යාපාරික ලාභ සහ පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීමේ පරිශ්‍රමයට ඉහලින් තැබෙන ආර්ථික ජීවිතයේ විප්ලවවාදී පරිවර්තනයක් සඳහා වන ක්‍රියා මාර්ගයක් අපි ඉදිරිපත් කරන්නෙමු.

දුප්පත්කම සහ පන්ති සූරා කෑම මුලිනුපුටා දමා සමාජ සමානත්වය මත පදනම් වූ අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියකින් එය විස්ථාපනය කරන කම්කරුවන්ගේ ආන්ඩුවකට සහ සමාජවාදී අනාගතයකට සටන් කරනු වස් තමන්ගේ ම ජනතා පක්ෂයක් ගොඩ නැගීම සඳහා ඩිමොක්‍රැටික් පක්ෂයෙන් බිඳී වෙන් වීමට කම්කරු පන්තියට ඇති අවශ්‍යතාව අපි අපේ ක්‍රියා මාර්ගයේ හරි මැද තබන්නෙමු.

අප මෙම ව්‍යාපාරය ගෙන යන්නේ ඡන්ද එකතු කර ගැනීමකට වඩා වැඩ කරන ජනතාව මුහුන දෙන ඇත්ත ගැටලු අරබයා බැරෑරුම් සාකච්ඡාවක් සහ සංවාදයක් විවෘත කර ලීමට සහ කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කර ගැනීමට අවශ්‍ය දේශපාලන අත්තිවාරම දමා ගැනීමට ය.

අපි යුද්ධයේ සහ සමාජ ප්‍රතිගාමීත්වයේ පක්ෂ දෙකට විකල්පයක් සොයමින් සිටින සියලු දෙනාට අපගේ මැතිවරන ක්‍රියා මාර්ගය අධ්‍යයනය කරන ලෙසට ද සසපය හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* හමු වන ලෙසට ද ඡන්ද පත්‍රිකාවල අපේ අපේක්ෂකයන් ලැයිස්තුගත කිරීමේ සටනට එක් වන ලෙසට සහ සසපයට එක් වී එය ගොඩ නැගීමට තීරනය කරන ලෙසට ද ඕනෑකමින් යුතුව ඉල්ලා සිටිමු.■

© www.wsws.org